වැලිගම ප්‍රාදේශීය සභාව,
මාතර දිස්ත්‍රික්කය.

-------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 09 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 17 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට වැලිගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු කර්මාන්ත ණයහිමිගේ රු.4,275,950 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ජ'නල් සටහන මඟින් නිවැරදි කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණයගැතිගේ රු.852,446 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ජ'නල් සටහන මඟින් නිවැරදි කරමි. |

**(ආ) නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.4,821,816 ක් වූ ගිණුම් විෂයයන් 04 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර, අසමානතා එකතුව රු.95,825 ක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසදා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම්

## 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) | | | |
| (i) රීති 204 | භාණ්ඩ සමීක්ෂණයෙන් පෙන්වා දී තිබූ ඌනතා සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඌනතාවයන් සම්බන්ධයෙන් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ii) රීති 217 | සභාව සතු ඉඩම් 08 ක් ඉඩම් ගොඩනැඟිලි ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) රීති 218 | සභාව සතු සියලු ඉඩම් හා ගොඩනැඟිලි පිළිබඳ වාර්ෂික සමීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉඩම් ගොඩනැගිලි සමීක්ෂණය මේ වන විට ආරම්භ කර ඇති අතර සියයට 60 ක් පමණ අවසන් කර තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.88,203,142 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.61,505,655 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 25,530,000 | 19,243,110 | 11,122,128 | 9,660,894 | 3,955,200 | 3,610,693 | 3,424,594 | 1,539,912 |
| කුලී | 3,698,000 | 2,749,988 | 2,807,592 | 1,295,296 | 3,735,600 | 3,245,491 | 2,654,143 | 1,352,900 |
| බලපත්‍ර ගාස්තු | 10,655,500 | 2,556,450 | 2,679,121 | 1,680,329 | 5,667,500 | 11,112,302 | 10,809,302 | 1,803,000 |
| වෙනත් ආදායම් | 120,589,200 | 116,637,093 | 30,911,101 | 269,862,720 | 60,655,000 | 78,512,849 | 33,411,971 | 184,136,728 |
| **එකතුව** | 160,472,700 | 141,186,641 | 47,519,942 | 282,499,239 | 74,013,300 | 96,481,335 | 50,300,010 | 188,832,540 |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) වරිපනම්** | | |
| ආරම්භක හිඟය රු.1,356,560 ක් වූ අතර, රු.13,468,978 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.14,825,538 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.5,474,344 ක් වූයෙන් වර්ෂය අවසානයට රු.9,351,194 ක් හිඟව පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | ඉදිරියේදී හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කරමි. |
| **(ආ) අක්කර බදු** | | |
| ආරම්භක හිඟය රු.120,161 ක් වූ අතර, රු.10,278 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.130,439 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුලදී මුළු අයවීම් රු.4,329 ක් වූයෙන් වර්ෂය අවසානයට රු.126,110 ක් හිඟව පැවතුණි. අයවීමේ ප්‍රගතිය සියයට 03 ක් තරම් පහළ මට්ටමක පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | ඉදිරියේ දී දේපල සමීක්ෂණයක් සිදු කර දේපල නිවැරදිව හඳුනා ගෙන හිඟ මුදල් අය කරගැනීමට කටයුතු කරමි. |

### 2.2.3 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු කඩ කාමර 30 කින් රු. 874,765 ක කුලී මුදලක් හිඟව පැවතුණි. | හිඟ කුලී කඩිනමින් අය කර ගත යුතුවේ. | මේ වන විට රු.96,228ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර ඇති අතර ඉතිරි හිඟ මුදල් ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.4 වෙනත් ආදායම්

**උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත | හිඟ ආදායම් කඩිනමින් | ප්‍රධාන ලේකම් හා ආණ්ඩුකාර වෙත ඉල්ලීම් |

| | | |
|---|---|---|
| වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.15,828,590 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.251,410,577 ක මුදලක් අය විය යුතුව තිබුණි. | අයකර ගත යුතුවේ. | කර ඇත. |

**2.2.5 අධිභාර**

---------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ----------- | ---------------- |
| ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු අයවලුන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂවල රු.7,495,624 ක් වූ අධිභාර 09 ක් පනවා තිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පනත ප්‍රකාරව අධිභාර අයකර ගැනීමේ වගකීම පළාත් පාලන කොමසාරිස්ගේ වගකීමක් වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**3.1 කාර්ය සාධන ඇගයීම**

-------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**3.1.1 අරමුණුවලින් බැහැර ක්‍රියාකාරකම්**

--------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| --------------------- | ----------- | --------------- |
| නිදංගල ආදාහනාගාරය ඉදිකිරීම වෙනුවෙන් 2010 ජනවාරි 28 දින දකුණු පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් ලැබුණු රු.4,360,000 ක මුදල පුනරාවර්තන වියදම් සඳහා වැය කර තිබුණි. | අදාළ අරමුණුවලට අනුව වියදම් දැරිය යුතුවේ. | ආයතනයේ ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් ලෙස වියදම් කර ඇත. |

**3.1.2 අත්හැර දැමූ කර්තව්‍යයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2007 වර්ෂයේ සොලිඩ් ලෝඩ්ස්ටාර් ආයතනයෙන් ලැබුණු රු.7,380,000 ක මුදලින් රු.3,020,000 ක් වැයකර නිදංගල ආදාහනාගාරය ඉදිකිරීම් කටයුතු සිදුකර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගෙන අත්හැර දමා තිබුණි. | අත්හැරදැමූ කර්තව්‍යයන් ඉටුකිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී මාතෘ හා ළමා සායන මධ්‍යස්ථානයක් ඉදිකිරීමට කටයුතු කරමි. |

**3.1.3 කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වරකපිටිය ආදාහනාගාරය | ව්‍යාපෘතිය නියමිත කාල වකවානුව තුළ නිමකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී මාතෘ හා ළමා සායන මධ්‍යස්ථාවයක් ඉදිකිරීමට කටයුතු කරමි. |
| (ii) | දෙනිපිටියේ ඉදිකිරිමට යෝජිත විශේෂ ආර්ථික මධ්‍යස්ථානය | ව්‍යාපෘතිය නියමිත කාල වකවානුව තුළ නිමකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2020 අයවැය යෝජනා යටතේ සකස් කිරීමට යෝජනා කරමි. |
| (iii) | දිවාරාත්‍රී වොලිබෝල් ක්‍රීඩාංගනය ඉදිකිරීම. | ව්‍යාපෘතිය නියමිත කාල වකවානුව තුළ නිමකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී වැඩ ආරම්භ කිරීමට කටයුතු කරමි. |

**3.1.4 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කසළ බැහැර කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් නොමැතිවීම හේතුවෙන් පෞද්ගලික ඉඩම්වලට බැහැර කළ කසල ආවරණය කිරීම | නොදිරන කසළ ප්‍රතිචක්‍රීකරණය කළ යුතුවේ. | කසළ මෙට්‍රික් ටොන් 15 ක් 20 ක් අතර ප්‍රමාණයක් දිනපතාම එක්රැස් කරනු ලබන අතර එම කසළ |

| | | | |
|---|---|---|---|
| | සඳහා පස් දැමීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ රු.11,607,740 ක වියදමක් දරා තිබුණි. | | කලකට පෙර අතහරින ලද පොල් ලෙලි වලවල්වලට හා හුණු ගල් හාරන ලද වලවල් වලට දමා දිනපතා ම පස්වලින් ආවරණය කර ඇත. |
| (ආ) | කසළ බැහැර කිරීම සඳහා හුවමාරු කරගෙන තිබූ ගරාඬුව කඩලාන ඉඩමට මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශවලට යටත්ව අනුමැතිය ලැබී තිබුණද ඒ සම්බන්ධයෙන් අවසන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නොදිරන කසළ ප්‍රතිචක්‍රීයකරණය කළ යුතුවේ. | ඉදිරියේදී යන්ත්‍රානුසාරයෙන් කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීමේ කටයුතු කරමි. |

**3.1.5 තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ , තිරසාර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ලගා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | සභාව විසින් 2019 වර්ෂයේ සිට සකස් කර ඇත. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස ආධාර ලබාදීමට රු.12,500,000 ක් සහා අරමුදලින් වෙන්කර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේ ජුනි 10 දින සකස් කරන ලද ව්‍යාපෘති වාර්තාව අනුව ඉලක්කගත ප්‍රතිලාභීන් ලෙස හඳුනා ගෙන තිබුණේ ස්ථිර නිවාස නොමැති හා ආබාධිත පුද්ගලයන් වේ. 2019 දෙසැම්බර් 10 දින වන විට ප්‍රතිලාභීන් 81 ක් සඳහා රු.3,240,000 ක් ගෙවා තිබුණු අතර, 2019 දෙසැම්බර් 10 දින නියැදි විගණන පරීක්ෂාවේදී ස්ථිර නිවාස හිමි පවුල් 7 කටද නිවාස ආධාර ලබාදී තිබුණි. | නිර්ණායක තීරණය කර ඉලක්කගත ප්‍රතිලාභීන් තෝරාගත යුතුවේ. | මෙම ක්‍රමවේදය නිරවුල්ව පැහැදිලිකර ගැනීම සඳහා ගත් නිර්ණායක කිහිපයක් සහිතව ලකුණු ලබා දීමේ ක්‍රමයක් සහිතව ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කරමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 14 ක් සම්පූර්ණ කර ගැනීමට හා 22 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ අතිරික්ත තනතුරු විධිමත් කරගැනීම හා පුරප්පාඩු සම්පූර්ණ කර ගත යුතුවේ. | 29/2019 චක්‍රලේඛය යටතේ ස්ථිර කිරීම සඳහා පළාත් පාලන දෙපාර්තමේනත්තුවට අනුමැතියට යවා ඇති තනතුරු අනුමත වූ පසු ප්‍රාථමික ශ්‍රේණියේ පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරමි. |
| **(ආ) සේවක ණය** | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට සේවකයින් 05 දෙනෙකුගෙන් අය නොවී පවතින රු.310,542ක් වූ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගත යුතුවේ. | අදාල නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරමි. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව සතු වෙළඳපොල සංකීර්ණ තුනකට අයත් කඩ කාමර 23 කින් රු.371,361 ක එක්වන් මුදල් 2006 වර්ෂයේ සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එක්වන් මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපස/5/6/පොදු හා 2010 දෙසැම්බර් 27 දිනැති චක්‍රලේඛය ප්‍රකාර කඩ කාමර 13 කට අදාලව වර්ෂ 03 කට වරක් ගිවිසුම් යාවත්කාලීන කර නොතිබූ අතර වර්ෂ 05 කට වරක් කඩ කාමර 17 ක තක්සේරු කුලිය සංශෝධනය කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වෙළඳ සංකීර්ණ ඉතාමත් අබලන් තත්වයේ පවතින බැවින් අලුත් වැඩියා සිදුකර තක්සේරු කුලිය ලබා ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සභාවට අයත් වෙළඳපොල සංකීර්ණවල පිහිටි කඩ කාමර බදු දීමට අදාළව කඩ කුලී ගිවිසුමෙහි 3 වන වගන්තිය ප්‍රකාරව එක් මාසයකට වඩා බදුකුලී ගෙවීම පැහැර හරින කඩහිමියන් 23 න් දෙනෙකු වෙනුවෙන්ද, 4 වන වගන්තිය ප්‍රකාරව කඩ කාමර 11 ක අනවසර ඉදිකිරීම් වෙනුවෙන්, හා ගිවිසුමෙහි 22 වන වගන්තිය ප්‍රකාර අනුමත නොකරන වෙළඳාම් පවත්වාගෙන යන මිරිස්ස වෙළඳපොලෙහි කඩ කාමරයක් වෙනුවෙන්ද අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | තාවකාලික අනවසර ඉදිකිරීම් ගලවා ඉවත් කරන ලෙස කඩකාමර හිමියන් දැනුවත් කිරීමට කටයුතු කරමි. |

**3.5 වත්කම් කළමණාකරණය**

**3.5.1 නිෂ්ක්‍රීය /ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| භාණ්ඩාගාර ලේකම්ගේ 2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන වත්කම් හා කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව ධාවනයෙන් ඉවත් කර තිබූ වාහන හා යන්ත්‍ර උපකරණ 06 ක් අපහරණය කර නොතිබුණි. | ඵලදායී කාර්යයක් සඳහා යොදාගැනීම හෝ ප්‍රයෝජනයට ගත නොහැකි නම් අපහරණ කටයුතු සිදු කළ යුතුවේ. | අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී ගනු ලබමි. |

**3.5.2 වත්කම්වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු ඉඩම් 04 ක පොල් හා තැඹිලි ඵලදාව බදුදීමට කටයුතු කර නොතිබුණි. | සභාව දේපල බදු දීමට කටයුතු කළයුතුවේ. | අවස්ථා තුනක දී ටෙන්ඩර් කරනු ලැබූ අතර, ඒ සඳහා කිසිදු ටෙන්ඩර් ගැනුම් කරුවෙකු ඉදිරිපත් වී නොමැත. |

### 3.5.3 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක 04/05/09 හා 2019 ජූලි 29 දිනැති ලිපිය ප්‍රකාර සහා බල ප්‍රදේශයේ පිහිටි සුසානභූමි 10 කට අදාල ඉඩම් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | උපදෙස් ලිපිය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී පවරා ගැනීමට කටයුතු කරමි. |

### 3.6 කොන්ත්‍රාත් පරිපාලනය

| Audit Observation | Recommendation | Comments by Accounting Officer |
| --- | --- | --- |
| Crematorium of Nidangala had been built with Rs.3,020,000 from Rs.7,380,000 received from Solid Lords tar institution in the year 2007. But it had been given up with no expected result even by the end of the year under review. | Actions should be taken to fulfil activities given up. | Future actions will be taken to construct a maternity and child clinic center. |

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක 3/2014 හා 2014 ඔක්තෝබර් 15 දිනැති මුදල් චක්‍රලේඛය ප්‍රකාරව (1:2:4) 3/4 ශ්‍රේඩ් 20 ප්‍රමාණයට කොන්ක්‍රීට් කිරීමේදී දකුණු පලාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හඳුන්වාදුන් ඝන මීටරයකට රු.17,228 රේටය භාවිතා කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී සභා අරමුදලින් සංවර්ධනය කරන ලද මාර්ග 03 කට අදාලව දකුණු පළාත් ගොඩනැඟිලි අධ්‍යක්ෂගේ CT-08 ඝන මීටරයකට රු.19,155 රේටය භාවිතා කිරීම නිසා රු.135,276 ක් වැඩිපුර ගෙවා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | සමාලෝචිත වර්ෂයේ මුල් භාගය සඳහා වන කාලය තෙක් 1:2:4(20) කොන්ක්‍රීට් සඳහා BSR මිළ ගණන් භාවිතා කළ අතර ඉන් පසුව HSR මිළ ගණන් භාවිතා කරමි. |